# සන්නස සාහිත්‍ය තරගාවලිය 2006

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව අතර සිංහල සාහිත්‍යය පිළිබඳව ඇතිව තිබෙන පිබිදීම ආශ්වාදජනකය. මේ මොහොතේ දී මෙරට සිට සිංහලෙන් ලියන ලේඛක ලේඛිකාවන් දිරිමත් කිරීම සිය වගකීමක් ලෙස සන්නස සලකයි. සන්නස වාර්ෂික සාහිත්‍ය තරග මාලාව ඇරඹෙන්නේ ඒ සිතිවිල්ල නිසා ය.

තරග මාලාව කෙටිකතා සහ කාව්‍ය වශයෙන් දෙකොටසකින් යුක්ත වෙයි. සහභාගිවන විවිධ වයස් කාණ්ඩ වලට අයත් ලේඛක ලේඛිකාවනට අසාධාරණයක් නොවන සේ විවෘත හා කණිෂ්ඨ වශයෙන් අංශ දෙකක් යටතේ තරග පැවැත්වෙයි.

**විවෘත අංශය**

වයස් සීමාවකින් තොරව ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට විවෘත තරග වලට සහභාගි විය හැකි ය.

**කණිෂ්ඨ අංශය**

වයස අවුරුදු 18 ට අඩු තරගකරුවනට/තරග කාරියනට කණිෂ්ඨ අංශය යටතේ තරග වැදිය හැකි ය.

**කෙටි කතා (විවෘත/කණිෂ්ඨ)**

**පොදු කොන්දේසි**

1 කෙටි කතා සඳහා වචන සීමාවක් නැත.
2 තමන්ට කැමති තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති නිර්මාණ සංඛ්‍යාවක් එවන්නට අවසර ඇත.
4 කෙටිකතාව තමාතේම නිර්මාණයක් බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමග එවිය යුතුය.

**කාව්‍ය නිර්මාණ (විවෘත/කණිෂ්ඨ)**

**පොදු කොන්දේසි**

1 වචන සීමාවක් නැත
2 තමන්ගේ අභිමතය පරිදි සඳැස් හෝ නිසඳැස් නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති සංඛ්‍යාවක් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවසර ඇත.
4 නිර්මාණය තමන්ගේම බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමගම එවිය යුතුය.

**සියළුම අංශ සඳහා පොදු කොන්දේසි**

1 සෑම නිර්මාණයක්ම **පිටපත් තුනකින්** යුතුව එවිය යුතු ය.
2 තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙයට පෙර මුද්‍රිත හෝ වෙනත් ආකාරයකින් හෝ ප්‍රකාශිත ඒවා නොවිය යුතු ය.
3 තරගයට එවන නිර්මාණ නැවත ආපසු එවීමට හැකියාවක් නැති බව සළකන්න.
4 නිර්මාණ බාරගන්නා අවසාන දිනය **2006 අප්‍රේල් 30** වෙයි.
5 තරගය පිළිබඳ මතුවන ගැටළු වලදී සන්නස සංස්කාරකගේ තීරණය අවසන් තීරණය බව සළකන්න.

**නිර්මාණ එවිය යුතු ලිපිනය**

සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2006
**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073
Australia




## හතර හිනාවයි

වාසානාවං.. වාසනාවං.. සන්නසේ ඇත්තන්ට වාසනාවං.. එදා තුරුන්නාන්සෙ මහත්තය කියාපු විස්තරේ අහල මටත් හිතුන සන්නසේ ඇත්තො එක්ක කතා බහ කරන්න ඇත්නං කියල. ඔය ඇත්තො ඕස්ටේලියාවෙ හිටියයි මම මෙහේ හිටියයි කියල නෑ. අපි එක රටේ මිනිසුසු. සිංහලයො නේ. ඔය බටහිර පන්නට මූන බදාගෙන තොඃ ගාල කිස්සක් නුදුන්නට අපේ ආයිබොවං වාසනාවං කියන එක ඊට වැඩිය දාස් වාරයක් ඉහලයි. අපි බුදුන්ට එකතු කරන අද්දෙක එකතු කරලා ආයිබොවං කියන්නේ ආ-ඉ - බෝ - වන් කියන තේරුමෙං. ආයුස ඉතා බොහෝ වේවා කියන එකයි ඒකෙ තේරුම. වාසනාවං කියන්නෙ වාසනාවන්ත වේවා කියන එක. වාසනාව කියන්නෙ බොහෝම ගැඹුරු වචනයක්. කිසි දේකිං අඩුවක් පාඩුවක් නැති සැප සම්පතින් පිරුණු කියන අදහස ඒකෙ තියනව. ගුරුන්නාන්සෙ මහත්තයට පින් සිද්ද වෙන්න ඔහෙත් දැං සිංහල දැනුම හොඳයි. අද ඉතිං හා හාපුරා කීයලා කතා බහ පටං ගත්ත දවසනේ. ඔන්න ආයෙත් පාරක් අය්බෝවං.. වාසනාවං..

එදා ගුරුන්නාන්සෙ මහත්තය එක්ක කතාව හිතුවට වැඩිය දික් උණා. මගෙ අම්මෝ දැං අපේ ගුරුන්නාන්සෙ මහත්තය දන්න දේවල්.මේ ඉන්ටනේට්ටෙං හරි හරි දේවල් දැන ගන්න පුලුවං ලු නේ. එදා අපේ කතාව දිග් ගැහුණෙ කැනඩාවෙයි ඉස්පානෙයි ගේ ජෝඩු හින්ද. ඒ රටවල ආණ්ඩු ගේ ජෝඩු වලට ඉඩ දුන්නනේ. ඔය අලුත් බහු බූත වලට සිංහල වචන හොයනවට වැඩිය හොඳයි ඉංගිරිස් වචනෙම මට්ටං කරල ගන්න එක. ඒ ගැන අපට වැඩය මේ ඇත්තො දන්නවා නේ. හතර හිනා කියන්නෙ ඕවට නේ. ආ.. මේ ඇත්තො දන්නවද හතර හිනාව..? මං හිතන්නෙ නෑ වෙන්ටෑ. ඕන්න එහෙනං අහගන්ට.

අපි මේ ඉඩකඩං බෙදා ගන්න බැරුව ඇන කොටා ගන්නව. උසාවි ගාටනව. මිනී මරා ගන්නව.. දෙමව්පියො දරුවො... සහෝදරයො සහෝදරියො... දරුකං සහෝදරකං නැති කර ගන්නව මේ ඉඩ කඩං හින්ද. සාංගික බුදලේ බෙදා ගන්ට බැරුව අපේ යතිවරයො උසාවි ගානෙ බඩ ගානව. දෙගොල්ලො දෙපැත්තෙ ඉඳං පහස කියනව.. කුණු හබ්බ කියා ගන්නව.. කුල නං ගං කියා ගන්නව. එතකොට පොළොව මහී කාන්තාව ..මිහිකත කන්දෙකේ ඇඟිලි ගහගෙන හිනා වෙනවලු.. කොහොමද බොලං මහ පොළොව උඹලගේ වුණේ කියල.

මං හෙට එන්නං ලබන සුමානෙ එන්නං .. ලබන අව්රුද්දෙ එන්නං.. ආය් හෙට හම්බු වෙමු.. පස්සේ හම්බු වෙමු කියලා එක එක්කෙනාට පොරොන්දු දෙනව නේ. එතකොට මාර දිවිය පුත්තරය හිනා වෙනවලු .. ඒ උඹල හෙටත් හිටියොත් නේ.. බලමු බලමු කියලා..

තාත්ත උදේ ඉඳං හැන්දෑ වෙනකල් නැහිල නැහිල වැඩපළ කරල.. මාන්සිවෙල. ගෙදර ඇවිත් ඇඟපත හෝදගෙන හීං එකා වඩාගෙන ඉඹ ඉඹ ඔලුවට උඩිං උස්ස ගෙන.. මය් කොල්ලහ්.. මගෙ රත්තරං පුතු පැටියහ් .. කිය කියා හුරතල් කරනකොට අම්ම අතිං කට වහගෙන දොරට මුවා වෙලා හිනා වෙනවලු..
දැං ඔතන තියෙන්නෙ තුං හිනාවක්නෙ.. ඔය ගේ ජෝඩු, ගේ බැඳුම්, ගේ මගුල් වගේ සිද්දියක් ඇහුවම අපට ඉබේටම කියවෙනව හතර හිනාවයි.. මේක හතර හිනාවක් නේ කියල.. දැං හරි නේ.. හිනා හතරයි.. ඕන්න හතර හිනාව. ඔය ගේ ජෝඩුවෙං මොකාද පිරිමියගෙ වැඩ කොටස කරන්නෙ? මොකාද ගෑනිගෙ වැඩ කොටස කරන්නෙ කියල වැඩ බෙදා ගන්නෙ කොහොමද කියලා මේ ඇත්තො දන්නව නං අනේ පිං සිද්දවෙයි අපේ ගුරුන්නාන්සෙ මහත්තයට ඊමේලක් එවන්නකො. එතකොට මට නොවරදවාම ඒක හම්බ වෙනව.

**කොරටුවෙගෙදර අප්පුහාමි**

## සන්නස තුම්පදය

තුන් පදය යන දෙපදය සන්ධි වෙලා එක් පදයක් හැදෙනව තුම්පදය කියලා. පදය යන පදයේ මිලින් ඇති ප යන්න නිසා ඊට මුලින් කියවෙන නැහැසි අකුර (ඕ,ඤ, ණ, න්, ම්) වන න් යන්න ප යන්නේ වර්ගාක්ෂරය (ප. ඵ. බ, භ. ම) බවට පත් වෙනවා. එතන සිදු වන්නේ ආදේශයක්. තුන් පළ තුම්පල වෙන්නෙත් ඒ වගේ.

**1 දිවිල්ගණේ/නේ**

ගණේ යන්න පර්වත යන තේරුම දෙන පදයක්. ගණේ ගිලපු අලියාට පිළිමය අග්ගලාවක් ලු යන රූඩියෙන් එය සනාථ වෙනවා. දකුණු පළාතේ ජූල් කියන්නෙ දිවිල් වලට. දිවිල්ගණේ කියන්නෙ දිවිල්ගස් සහිත පර්වතය (කන්ද) විය හැකි ය. ඒ දෙපදය සන්ධි වෙන්නේ නැහැ. සමාස වෙනවා පමණයි.

**2 දන්දෙණිය**

දම් ගසින් වැසුණු දෙණිය දම් දෙණිය යි. ඒ දෙපදයත් සන්දි වෙලා තනි පදයක් වීමේ දී වර්ගාක්ෂරය (න් - ද) ආදේශ වෙනවා. ගම් තුන - ගන්තුන වෙන්නේ ඒ විදිහට.

**3 පෝද්දල**

පුංචි කාලෙ අපි කෝත්තියෙන් පෝද්දල් ගියා. කෝච්චි පෙට්ටි එක එකා අල්ලාගෙන. ඒ උණා ට එතන ල් වෙල්නේ නෑ වගේ පුවක් ගස් බහුලව ඇති මණ්ඩියක් මැදින් ගලන එම දොළේ නිතරම පුවක් පාවී එන්න ඇති. ඒ නිසා එය පුවක් දොළ නමින් හඳුන්නන්ට ඇති. පුවක් දොළ වර්ගාක්ෂරය අනුව පුවද්දොළ යනුවෙන් සන්ධි වෙනවා. උව, අව - ඕ වීම අපේ බසේ රීතියක්. (මුව දොර - මොදර, ගව - ගෝ , මව - මෝ ) ඒ අනුව පුවද්දොළ ම පෝද්දළ වී ඇති බව පේනවා.


පොත් ප්‍රකාශණයේ ජය කෙහෙළි නැංවූ

දයාවංශ ජයකොඩි සහ සමාගම

සිය ඔස්ට්‍රේලියා නියෝජිතයන් වශයෙන් අප පත් කරගෙන ඇති බව සතුටින් දැනුම් දෙමු

සියලු සිංහල පොත පත ගෙදරට ම ගෙන්වා ගන්න දැන් ඔබට වරම්

SINGHE
Marketing Services

7/438 Camp Road
Broadmeadows 3047
Tel: 0413 829 370




නවකතා
සත්සයුර ජයසේන ජයකොඩි ඩොලර් 8.00
තිසර සිහිනය නිව්ටන් ගුණසේකර ඩොලර් 9.00
මයෙ නේත්නරා අජිත් ගලප්පත්ති ඩොලර් 8.00
දෙන්නට දෙන්නා යසවර්ධන රුද්‍රිගු ඩොලර් 8.00
සමුගනිමි පී ඇම් ජයතිලක ඩොලර් 8.00
මහ මිහිඳු හිමිජයසේන ජයකොඩි ඩොලර් 9.00
මිදිගු නදියහිව්ටන් ගුණසේකර ඩොලර් 8.00
හාන්තානේ කඳු මුදුන සිසාරා පර්සි තේනුවර ඩොලර් 8.00
නිසලා සහ විශාඛා ජයකොඩි සෙනෙවිරත්න ඩොලර් 9.00
පොඩි මහත්තයා හදුජි මහින්ද ජයතිලක ඩොලර් 8.00
රන් තරුව ජයකොඩි සෙනෙවිරත්න ඩොලර් 9.00
තුන් යාමයේ සිහිනය ජයන්ත මංගල රාජපක්ෂ ඩොලර් 8.00
පාරුව පදින තුරු ඒ එම් කරුණාරත්න ඩොලර් 8.00

බුදු දහම
සම්බුදු හිමි අසම සමයි පී ඇම් ජයතිලක ඩොලර් 8.00
බුදු දහම හා ලෞකික ජීවිතය
මහාචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමි ඩොලර් 8.00
බෞද්ධ දර්ශනය අත්තුඩාවේ සිරි රාහුල මහ නාහිමි ඩොලර් 7.00
හුදකලාවේ අමාසුවය පූජ්‍ය වැල්ලම්පිටියේ විනයවංශ හිමි ඩොලර් 8.00
සැරියුත් හාමුදුරුවෝ ගයාන් චානුක විදානපතිරණ ඩොලර් 9.00

විවිධ
සිංහල ජාතිය පාවාදීම කේ එච් ජේ විජේදාස ඩොලර් 8.00
වලගම්බා රජ්ජුරුවෝ පූජ්‍ය එල්ලාවල මෙදානන්ද හිමි ඩොලර් 8.00
බෙල්ලන ඤාණවිමල මහ නාහිමි
ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර අනුනාහිමි ඩොලර් 8.00
වැව් බැඳි රාජ්ජේ සවාරියක් එඩ්මන්ඩ් ජයසූරිය ඩොලර් 8.00
සේරුවිල සුන්දර අත්දැකීම් විමලසේන ජයලත් ඩොලර් 7.00

තැපැල් හා දැවටුම් ගාස්තු එක් පොතක් සඳහා ඩොලර් 2.00
සිංහ මාකට් සර්විසස් නමට ලියන ලද මුදල් ඇනවුමක්/චෙක් පතක් එවා තැපෑලෙන් ලබාගන්න.